**ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1. 3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### 1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වත්කම් අත්පත් කරගැනීම යටතේ වූ ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් දැරූ මුළු වියදම රු.1,129,353 ක් වුවත් එහි ප්‍රාග්ධනීත කල වටිනාකම රු.517,005 ක් වූයෙන් රු.612,348 ක වියදම ප්‍රාග්ධනීත කර නොතිබුණි. | කම්බි වැට ඉදිකිරීම සහ දැල් වැට ඉදිකිරීම සඳහා දරන ලද එකතුව රු. 612,348 ක මුදල වෙනසට හේතුව වේ. මෙම වියදම් 2024 අප්‍රේල් මස ගිණුම් සාරාංශය මගින් ප්‍රාග්ධනීත කර මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් ගත කරන ලදි. | වර්ෂයට අදාළ සියලුම වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | කොමසාරිස් ජනරාල්වරයාගේ නිල නිවස ඉදිකිරීමට රු.මිලියන 36.4 ක මුදලක් ගෙවීම් කර 2020 වර්ෂයේදී අවසන් කර තිබුණද නිවස තක්සේරු කර හෝ ඉදිකිරීමට ගෙවූ වටිනාකම 2023 මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි. | කොමසාරිස් ජනරාල් වරයාගේ නිල නිවස ඉදිකිරීමට ගෙවූ වටිනාකම 2024/04/10 දින මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුලත් කරන ලදි. | සියලුම වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

#### 1.6.1.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ටැබ් (TAB) පරිගණක 317 කට අදාළ සිම්පත් වෙනුවෙන් 2023 ජුනි මාසයේ මොබිටෙල් සමාගම වෙත රු. 468,589 ක් ගෙවා ඇතත් මෙම සිම්පත් සහ ටැබ් (TAB) පරිගණක 244 භාවිතා කරන්නන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | ප්‍රාදේශීය කාර්යාල වලට නිකුත් කිරීම් නියෝග මගින් බෙදා දී එම කාර්යාල වල ඉන්වෙන්ට්‍රි වලට ඇතුලත් කර ඇත. එම ටැබ් යන්ත්‍ර වල අගයන් දෙපාර්තමේන්තු මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් ගත කල නොහැකි බව දන්වමි. සිම්පත් වෙනුවෙන් මාසික බිල්පත් ගෙවීම ගිණුම් අංශයට ඉදිරිපත් වන්නේ e-Slims වැඩ සටහන ක්‍රියාත්මක කරන අංශයෙන් බැවින් අදාල තොරතුරු එම අංශයේ පවතී. | සියලුම වත්කම් ගිණුම්ගත කර සිම්පත් භාවිතා කරන්නන් පිළිබඳ තොරතුරු ලේඛනගත කළ යුතුය. |

### 1.6.1.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891 ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් , මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධව පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කොට පවත්වා නොතිබුණි. | ඉදිරියේදී යාවත්කාලීන කරනු ලැබේ. | සේවක ඇප ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි අංක 460 විධිවිධාන අනුව රැස් කරනු ලබන ආදායමේ යම් දෝෂයක්, අඩුපාඩුවක් සිදු වුවහොත් එම දෝෂය ඇතිවූ වහාම හා මුදල් වර්ෂයේ භාණ්ඩාගාර පොත් පියවීමට පෙර නිවැරදි කළ යුතු අතර එසේ නිවැරදි නොකරන ලද දෝෂ නිසා එම වර්ෂයේ ගිණුම් මගින් වැරදි ආරෝපණයක් පෙන්නුම් කරනු ලැබේ. සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ඉඩම් බදු ආදායම් හා අනෙකුත් බදු කුලී ආදායම වන රු.150,083,569 ක් තුළ පළාත් සභා ආදායමට බැරවිය යුතු රු.2,002,427 ක් වැරදීමකින් ඇතුළත් වීම හේතුවෙන් දෙපාර්තමේන්තු සත්‍ය ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 අවසාන ගිණුම් වලින් අනාවරණය වූ රු.2,002,427 ක් වැරදි බැර කිරීම් ආදායමෙන් ආපසු ගෙවීම සඳහා අනුමැතිය ලැබී ඇත. අදාල නිවැරදි කිරීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ගිණුම් සාරාංශ හරහා නිවැරදි කිරීම සඳහා කාලයක් වැය වන නිසා 2023 ප්‍රධාන කාර්යාලය විසින් මෙකී නිවැරදි කිරීම කල හැකි බැව් භාණ්ඩාගාරයෙන් වාචිකව විමසුම් කරන ලදි. | නිවැරදි ආදායම් පමණක් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ඉඩම් බදු ආදායම් හා අනෙකුත් හිඟ බදු කුලී රු.101,227,690 ක් වූ අතර ඒ තුළ වර්ෂ 03 කට වඩා වැඩි හිඟ බදු කුලි රු. 47,459,534 ක් හෙවත් සියයට 47 ක් වී තිබුණි. | හිඟ බදු අයකරගැනීමට අදාල බදුකරුවන් දැනුවත් කරමින් වැඩසටහන් ක්‍රියාත්මක කරන බව දැනුම් දෙමි. | කඩිනමින් හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේදී පාඩු හා කපා හැරීම් යටතේ වෙන් කළ රු.100,000 ක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | 2023 වර්ෂය වෙනුවෙන් පාඩු හා කපා හැරීම් සිදු නොවීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | අවශ්‍යතාවය මත පමණක් ප්‍රතිපාදන වෙන්කර ගත යුතුය. |
| (ආ) | මූලධන වැය විෂයයන් 02 කට අදාළව උපයෝජනය නොකළ ප්‍රතිපාදනය රු.28,133,652 ක් විය. එය ලබාදුන් ප්‍රතිපාදනයෙන් සියයට 25 ත් 56ත් අතර අගයක් විය. | සැලසුම් කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීමත් ප්‍රාග්ධන භාණ්ඩ මිළදී නොගැනීමත් රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව කටයුතු කිරීම හේතුවෙන් මෙම ඉතිරිවීම සිදු වී ඇත. | ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් මස විදුලි බිල්පත් වටිනාකම රු.1,743,205 ක බැරකම් මූල්‍ය ප්‍රකාශන තුළ හදුනාගෙන නොතිබුණි. | මෙම වියදම පුනරාවර්තන ස්වභාවයේ සේවාවන් වන බැවින් ඊලඟ මුදල් වර්ෂය තුල ගෙවීම් කිරීම සඳහා බැරකම්වලට බැඳීමේ හැකියාවක් පවතින බව කාරුණිකව දන්වමි. ගෙවීම් වවුචර් අතපසුවීමකින් මූල්‍ය ප්‍රකාශන තුල බැරකම් ලෙස සටහන් වී නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල බැරකම් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1645(අ) හා 1647(අ) | | ක්‍රමවත් ලෙස හා විධිමත් ලෙස සම්පූර්ණ කර වාහන ලොග් සටහන් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී එම තොරතුරු ලොග් සටහන් පොත් වල යාවත්කාලින කිරීමට ප්‍රවාහන විෂය භාර නිලධාරියාව දැනුවත් කර ඇත. ධාවන සටහන් සාරාංශය මාසිකව පිළියෙළ කරනු ලැබේ. | මුදල් රෙගුලාසි උපදෙස් ප්‍රකාරව වාහන ලොග් සටහන් පොත් පවත්වා ගෙන යා යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| | i. XXIV පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය | 186,140 | 2023 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය රු.186,440 ක් විය. | විශ්‍රාම පාරිතෝෂිත ගෙවා ඇති කිසිඳු නිලධාරියෙකුගේ ණය ශේෂයක් අත්තිකාරම් බී ගිණුමේ ඇතුළත්ව නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. | ආයතන සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | ii. ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේද යේ 4.5 සහ 4.6 වගන්ති | 256,074 | වැඩ තහනම් කළ නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු එකතු ණය ශේෂය රු.256,074 ක් වූ අතර එම ණය ශේෂය තුළ වර්ෂ 05 ට වැඩි ණය ශේෂ රු.161,424 ක් සහ වර්ෂ 03 ත් 05 ත් අතර ණය ශේෂය රු.94,650 ක් විය. | 2024.05.31 දිනය වනවිට රු.27,432 ක මුදලක් එම ණයශේෂ 03 න් ම අයකරගෙන ඇති අතර තවදුරටත් අයවිය යුතු ශේෂය රු.244,578 ක් වන අතර එම ණය ශේෂය හැකි ඉක්මනින් අයකර ගන්නා බව දන්වමි. | හිඟ ණය ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | | 321,785 | 2018 වර්ෂය සහ ඉදිරි වර්ෂවල මරණ පාරිතෝෂිත ලබාදී ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිඳු ශේෂයක් තම ආයතනවල අත්තිකාරම් බී ගිණුමේ ඇතුළත් නොවීමට ආයතන ප්‍රධානීන් විසින් වගබලා ගත යුතුය යන්න රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 හි 04 වගන්තියෙහි සඳහන් කර තිබුණද 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ත් 03 ත් අතර රු.149,232 ක්ද සහ වර්ෂ 01 ට අඩු රු.172,553 ක්ද වශයෙන් රු.321,785 ක ශේෂයක් නොපියවා පැවතුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොමැත. | හිඟ ණය ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර එය මහජනයාට විවෘත වන පරිදි ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සකසා ප්‍රදර්ශනය කිරීම නිසා ඇති වන ගැටළුකාරී තත්ත්වය හා ඒ සඳහා උපදෙස් පතා මාගේ සමාංක LCGD/AD/15/50 සහ 2023.11.27 දිනැතිව විගණකාධිපතිට ලිපියක් යොමුකර ඇත. | අදාළ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.5 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරිම හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි අංක 371(5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් ගෙවන නිලධාරීයා විසින් ස්වකීය අතුරු අග්‍රිමය පිළිබඳ ගණන් හිලව් ඉදිරිපත් කළ යුතු අතර අදාළ කාර්ය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත් 2023 වර්ෂයේ අවස්ථා 6 ක දි නිතුත් කරන ලද එකතුව රු.152,000 ක් වූ අග්‍රිම නියමිත දිනට පියවා නොතිබුණි. | ඉදිරියේදී ලබා ගන්නා අත්තිකාරම්, මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ කාර්යය නිම කල වහාම පියවන ලෙසට ලිඛිතව උපදෙස් ලබාදීමට කටයුතු කරන ලදී. | මුදල් රෙගුලාසි උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිරවුල් බිමක අයිතිය තහවුරු කෙරෙන විධිමත් කළමනාකාරිත්වයක් පවත්වා ගෙන යෑම දෙපාර්තමේන්තුවේ ‘මෙහෙවර’ ලෙස දක්වා ඇතත්, ඉඩම් පිළිබඳ තොරතුරු හා දත්ත ලබාගැනීමේදී දෙපාර්තමේන්තුව තුළ බදුදීම්, ඉඩම් බැහැර කිරීම්,දීමනාපත්‍ර ලබාදීම, බදු නිදහස් කිරීම, බදු සහන ආදී තොරතුරු ලබා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් විගණිත දිනය වන 2024 අප්‍රේල් 02 දින වන විටද පවත්වා නොතිබුණි. | සැලැස්ම සකස් කර ඇත.බදු අංශයේ දැනට පවත්වා ගෙන යනු ලබන්නේ ගොනු කඩිනමින් සොයා ගැනීම සඳහා නිර්මාණය කල දත්ත පද්ධතියක් බැවින් යම් කරුණකට අදාළව සෙවීම් කිරීමට හැකියාවක් නොමැති අතර e-slims මඟින් නව දත්ත පද්ධතියක් නිර්මාණය කර දෙන ලෙස ඉල්ලා ඇත. උරුමය වැඩසටහනේ වර්තමාන ක්‍රියාකාරකම් වලින් පසු දැනට බදු අංශය වෙනුවෙන් නිර්මාණය කර ඇති යෙදවුම වැඩිදියුණු කර බදු ගොනුවලට අදාළ දත්තයන් පරිගණකගත කිරීමේ වැඩසටහනක් කඩිනම් කිරීමට e-slims අංශය | ඉඩම් සම්බන්ධව යාවත්කාලීන කළ ඉඩම් ලේඛනයක් හෝ තොරතුරු පද්ධතියක් පවත්වාගත යුතුය. |

| | | |
|---|---|---|
| | එකඟතාවය පල කර ඇත .මේ වන විට අන්තර් පළාත් කාර්යාලවලට අදාළ බදු ගොනුවල තොරතුරු එම පද්ධතියට ඇතුලත් කර තිබේ. | |

**3.2 සැලැසුම් කිරිම**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදය අනුව සියලුම රජයේ කාර්යාල විසින් තම ආයතනය වෙනුවෙන් සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරිම සඳහා ඉදිරි වර්ෂ සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වූවත් 2023 වර්ෂය සඳහා සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම 2023 ඔක්තෝබර් 13 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත මාස 10 කට පසු ඉදිරිපත් කර තිබුණි. | අත්‍යවශ්‍ය කරුණු මත සකස් කරන ලද ක්‍රියාකාරී සැළැස්මක් සංශෝධනය කිරීමේ අවස්ථාවන් තිබිය හැකිය. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 කාර්යභාරයන් ඉටු නොකිරිම**

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තු 4 කින් හා අන්තර් පළාත් කාර්යාල 02 ක් මගින් බදු දී ඇති ගොනු සංඛ්‍යාව 10,180 කින් E-Slims පද්ධතියට ඇතුළත් කර තිබු ගොනු සංඛ්‍යාව 2,759 ක් හෙවත් සියයට 27 ක් විය. | නිලධාරීන් ප්‍රමාණවත් නොවීම සහ නුපුහුණු මට්ටමක සිටීම මෙහි ප්‍රගතිය යම් මට්ටමකින් අඩු වීමට හේතු වී ඇති අතර, 2024 වසර තුල අදාල දැනුවත් කිරීම් කරමින් බදුකරවලට අදාල සියලු තොරතුරු පද්ධතිගත කරවා ගැනීමට කටයුතු කරමින් පවතී. | e-Slims පද්ධතියට දත්ත යාවත්කාලීන කිරිම කඩිනමින් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව බදු ගෙවීම් ඇතුළු අනෙකුත් කාර්යයන් මාර්ගගත ක්‍රමයට සිදු කිරීමට බැංකු ගිණුම් 10 ක් මගින් සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ කිරීමට සැලසුම් කර තිබුණි. 2013 වර්ෂයේ ආරම්භ වූ මෙම E-slims පද්ධතිය දැනට වසර 10 ක් ගත වී ඇතත් නියමිත පරිදි බදු නිර්දේශ ලබා දී , බදු අනුමැතිය ලබා දීම හා බදුගෙවීම මාර්ගගත ක්‍රමය මගින් සිදු කර ගැනීමට 2023 දෙසැම්බර් 31 දින වන විට නොහැකි වී තිබුණි. | මේ වන විට බදු නිර්දේශ ලබා දී, බදු අනුමැතීන් ලබාදීමේ ක්‍රියාවලියට අදාල වැඩ පියවරයන් e-Slims පද්ධතිය ඔස්සේ අමාත්‍යාංශය දක්වා සිදු කිරීමේ හැකියාව සලසා ඇත. බදු ගෙවීම මාර්ගගත ක්‍රමයට සිදු කිරීම 2013 වර්ෂයේදී සැලසුම් කරන ලද්දක් නොවේ. මෙය රට තුල ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මහජනතාවට ඉතා සුහදශීලී හා කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් මාර්ගගත ක්‍රමය ඇතුලු විකල්ප ක්‍රම භාවිත කරමින් හා ආරක්ෂා සහිතව සිදුකිරීමට හැකිවන පරිදි නව ක්‍රමවේදයක් සකස් කිරීමේ අවශ්‍යතාවය මත 2021 වර්ෂයේ අග භාගයේ පැණනැගුණකි. | නොපමාව අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

## 3.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයන්හි ඉලක්කගත දත්ත කාර්යය සාධන වාර්තා තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර 5,000 ක් හා දීමනා පත්‍ර 14,000 ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද 2023 දෙසැම්බර් 31 වන විට බලපත්‍ර 722 ක් හා දීමනා පත්‍ර 6,367 ක් නිකුත් කර තිබුණු අතර එහි ප්‍රගතිය පිළිවෙලින් සියයට 14 ක් හා 45 ක් වී තිබුණි. | 2023 වර්ෂයේ බලපත්‍ර 848 ක් සහ දිමනා පත්‍ර 6,367 ක් නිකුත්කර ඇත.එය පිළිවෙලින් සියයට 17 ක් සහ 45 ක් විය. | සැලසුම් කල බලපත්‍ර හා දීමනා පත්‍ර නිකුත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී ඉඩම් 70,000 ක තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීමට සැළසුම් කර තිබුණද දෙසැම්බර් 31 දිනට ඇතුළත් කර ඇති ඉඩම් තොරතුරු සංඛ්‍යාව 20,492ක් හෙවත් සියයට 30 ක අගයක් බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව විසින් ඉඩම් ලේඛන පිළිබඳ දත්ත පද්ධතියට ඇතුළත් කිරීමක් සිදු නොවන අතර රජය සතු ඉඩම් හඳුනාගැනීම සහ ඊට අදාල දත්ත පද්ධතිගත කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු වගකීමක් වන බැවින් ඒ සඳහා අවශ්‍ය කරන පුහුණුකිරීමේ වැඩසටහන් අදාල නිලධාරීන් වෙත ලබාදීම e-Slims අංශය විසින් අඛණ්ඩව සිදු කර ඇත. ඉඩම් රාජකාරී කටයුතු සිදු කිරීම අනිවාර්ය කිරීම මැයෙන් 2022.01.31 දිනැතිව චක්‍රලේඛ 01/2022 අංක දරණ චක්‍රලේඛයද නිකුත් කර ඇත. | දෙපාර්තමේන්තුව සතු ඉඩම් ලේඛණ පිළිබද තොරතුරු යාවත්කාලීන කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2013 වර්ෂයේ සිට ආරම්භ කර ඇති රජයේ ඉඩම් කළමණාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘතිය වසර 05 කින් නිමකිරීමට සැළසුම් කර දැනට වසර 10 ක් ගතවී ඇතත්, විගණිත දින දක්වා සම්පූර්ණ වී නොතිබුණි. | 2013 වර්ෂයේදී ආරම්භ කලද, නව සේවක බඳවා ගැනීම්, සේවක මාරුවීම්, සේවකයින් විශ්‍රාම යාම හෙවත් පූර්ණ කාලීන සේවකයන් මේ වෙනුවෙන් වෙන් නොවීම හේතුවනේ අඛණ්ඩව පද්ධතිය ආශ්‍රිත පුහුණු වීමේ වැඩ සටහන් පැවැත්වීමට සිදුව ඇත. එබැවින් ඊට විසඳුමක් වශයෙන් පුහුණුවන්නන් පුහුණු කිරීමේ කණ්ඩායමක් සැකසීමට අදාල පියවර ගෙන ඇත. | ඉලක්කගත දත්ත ඉවුකර ගැනීමේ උපරිමයට ලඟාවීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර ලේකම්ගේ අංක 05/2022 හා 2022 අප්‍රේල් 04 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව රජයේ දේපළ අස්ථානගත වීම සහ අවභාවිතය වැළැක්වීමට මෙන්ම රජයේ දේපළ උපරිම ඵලදායීතාවයෙන් ප්‍රයෝජනයට ගැනීම තහවුරු කරගැනීම සඳහා, රජය සතු සියලුම මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි ලේඛනගත කර පවත්වා අදාල චක්‍රලේඛ විධිවිධාන අනුව යාවත්කාලීන කර නියමිත දිනට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව සතු නිල නිවාස හා සංචාරක බංගලා එකතුව 407 ක් පවතින අතර එයින් නිල නිවාස 399 ක් පැවතියද 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ලෙස සිගාස් පරිගණක පද්ධතිය තුළ වාර්තාගත කර ඇත්තේ නිල නිවාස 247 ක් වු අතර ඉතිරි නිල නිවාස 152 ක තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ හඳුනා ගෙන නොතිබුණි. | මෙතෙක් තක්සේරු නොකරන ලද නිල නිවාස තක්සේරු කිරීම තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් සිදු කරන තෙක් දළ තක්සේරුවක් ලබා ගැනීම සඳහා සාමාජිකයන් 3දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කර තක්සේරු වාර්තාවක් එවන ලෙසට අන්තර් පළාත්/සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල වෙත දැනුම් දී ඇති අතර මහියංගණය,කන්තලේ හා මොණරාගල කාර්යාල වෙතින් මේ වනවිට වාර්තා ලබා දී ඇත. | නිල නිවාස තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමටත්, නිල නිවාසවලින් උපරිම ඵලදායිතාවක් ලැබෙන අයුරින් කටයුතු කළ යුතුය. |
| (ආ) | රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද යන්න දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් හඳුනාගෙන නොතිබුණු අතර ලේඛන අනුව දැනට පවත්නා ඉඩම් ප්‍රමාණය කොපමනද යන්න හඳුනාගැනීම සඳහා ඉඩම් සම්බන්ධ තොරතුරු පවතින ආයතන සමඟ සම්බන්ධ වෙමින් E-Slims පද්ධතියේ කටයුතු ඉටු කිරීමට ක්‍රමවේදයක් සකස්කිරීමට විගණිත දින වු 2024 මාර්තු 25 වන විටත් කටයුතු කර නොතිබුණි. | රජය සතු ඉඩම් ප්‍රමාණය හඳුනාගනිමින් ඒ පිළිබඳ දත්ත පද්ධතියට ඇතුළත් කිරීම අදාල ප්‍රාදේශීය ලේකම් කායීල සතු වගකීමක් වන අතර ඒ වෙනුවෙන් අවශ්‍ය පුහුණුකිරීම් විෂයභාර නිලධාරින් සහ ජනපදඉඩම් නිලධාරින් වෙතතවදුරටත් ලබාදෙමින් ඉඩම් සම්බන්ධ තොරතුරු පවතින ආයතන සමඟ සම්බන්ධ වෙමින් පද්ධතියේ කටයුතු ඉටු කිරීමට ක්‍රමවේදයක් සකස් කරමින් පවතී. | රජය සතු ඉඩම් හඳුනාගෙන එම දත්ත යාවත්කාලීන කළ යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ හිඟ බදු වටිනාකම රු.101,227,690 ක් වූ අතර ඉන් අන්තර් පළාත් කාර්යාල 08 ට අදාළව අවුරුදු 03 ක් ඉක්මවූ හිඟ බදු රු.47,459,534 ක් විය. එසේම ඉඩම බදු දුන් පාර්ශවයේ නම, බදු දුන් දිනය,ඉඩමේ පිහිටීම හා බදු දී ඇති ඉඩමේ ප්‍රමාණය ආදී තෙරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර හිඟ බදු අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හා නියමිත පරිදි බදු අය නොවීම කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර නොමැති බව නිරීක්ෂණය විය. | බදු ගොනු 6,000 කට සීමිත කාර්ය මණ්ඩලයකි. එසේම ඉදිරියේ දී අන්තර් පළාත් කාර්යාලවල ඉඩම් කොමසාරිස්වරුන් හා සහකාර ඉඩම් කොමසාරිස්වරුන්කැඳවා මාස 06කට වරක් හිඟ බදු අය කිරීමේ ප්‍රගතිය සාකච්ඡාකිරීමටත් බදු නොගෙවන බදුකරුවන් සම්බන්ධයෙන් ගතයුතු පියවර සාකච්ඡා කිරීමටත් සැලසුම් කර ඇති අතර එහි පළමු රුස්වීම මැයි 10 දින පැවැත්වීමට කටයුතු යොදා ඇත. | නොපමාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ 2017,2018,2019 වර්ෂවලට අදාළව හිඟ බදු ලිපිගොනු සංඛ්‍යාව 550 කට ආසන්න වූවත්, 2023 දෙසැම්බර් 31 දින වන විට හිඟ බදු අයනොවීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර තිබුණේ ලිපිගොනු 10 ක් සඳහා පමණක් බව නිරීක්ෂණය විය. | මේ වනවිට නීත්‍යාණුකූලව කටයුතු කිරීම සඳහා නීති අංශයට ගොනු 149 ක් යොමු කර ඇති අතර මෙම බදුකරුවන්ට නඩු පැවරීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා වාර කිහිපයක් පවත්වා ඇත. එසේම රු.100,000 ට අඩු හිඟ බදු මුදල් පවතින ගොනු සම්බන්ධයෙන් ගතයුතු පියවර පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් විමසීමට කටයුතු කර ඇත. | අයකර ගත නොහැකි බදු ලිපිගොනු සම්බන්ධයෙන් නොපමාව නීතිමය පියවර ගත යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුවට අයත් මුණසිංහගොඩ ග්‍රාම නිලධාරී වසමේ බොල්ලච්චදෙනිය ගමේ පිහිටි පිඹුරු අංක 4040 හි කැබලි අංක 01 දරණ ඉඩමෙන් හෙක්ටයාර් 2.932 ක් බදු ගොනු අංක 4/10/26617 යටතේ ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් ඉදි කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට වාර්ෂික බදු ලෙස රු.230,000 කට 2009 මැයි 06 වන දින සිට අවුරුදු 30 ක් සඳහා ලබා දී ඇතත් මෙම ඉඩම වෙනුවෙන් විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 31 දින වන විටත් බදුකරයක් ලබා දී නොතිබුණි. | මෙම බදුකරයට ඇතුළත් කළ යුතු කොන්දේසි සම්බන්ධයෙන් 2018.03.11දිනැතිව ඉඩම් අමාත්‍යාංශය වෙතින් උපදෙස් විමසා ඇති අතර එකී උපදෙස් මත නැවත බදු ඔප්පු කෙටුම්පත සකස් කර 2021.02.01 දිනැතිව ප්‍රාදේශීය ලේකම් වෙත යවා ඇත .එකී කෙටුම්පත අත්සන් කර එවන ලද නමුත් ගරු ජනාධිපතිතුමා වෙනස්වීම මත නම සංශෝධනය කල යුතු බැවින් නැවත බදු ඔප්පු කෙටුම්පත සංශෝධනය කර 2022.11.02 දිනැතිව ප්‍රාදේශීය ලේකම් වෙත යවා ඇති අතර එය 2022.12.05 දිනැතිව මා වෙත එවා ඇත. එහෙත් බදු ඔප්පු කෙටුම්පතේ නිවැරදි ස්ථානයන්හි බදුකරු අත්සන් තබා නොමැති බැවින් නැවත බදු ඔප්පු කෙටුම්පත සකස් කර අත්සන් යෙදීම සඳහා මෙම කාර්යාලයට පැමිණෙන ලෙස දැනුවත් කළද නොපැමිනීම හේතුවෙන් නැවත 2024.02.13 දිනැතිව | බදුකර ලබා දීමට නොපමාව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රාදේශීය ලේකම් වෙත යවා ඇත. | |
| (ඇ) | මහියංගනය (අන්තර්පළාත්) ඉඩම් කාර්යාලයට අයත් මහනුවර දිස්ත්‍රික්කයේ මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හසලක නගරයේ පිහිටි පිඹුරු අංක 298 කැබලි අංක 549 හි පර්චස් 7 ක ඉඩම ව්‍යාපාරික කටයුත්තක් සඳහා බදු අංක 4/10/40727 යටතේ ව්‍යාපාරිකයෙකු වෙත 2014 සැප්තැම්බර් 26 දින සිට වසර 05 කට වරක් බදු සංශෝධනයට යටත්ව බදු දී ඇතත් බදුකරු වෙත බදුකරයක් ලබා දී නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට හිඟ බදු මුදල රු.624,000 ක් බව ලිපිගොනුව පරික්ෂාවේදී අනාවරණය විය. | මෙම ඉඩම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සතු ඉඩමක් යන කරුණ මුල් කරගනිමින් ටෙලිකොම් ආයතනය විසින් මහනුවර දිසා අධිකරණයේ 2017වසරේදී /19845එල් නඩුව හේරත් මුදියන්සේලාගේ රංජිත් බණ්ඩාර හේරත් මහතාට විරුද්ධව පවරා ඇති බැවින් බදු මුදල් අය කිරීම 2017වසරේ සිට නවතා ඇත . ඉඩමේ අයිතිය රජය ලෙස පිඹුරේ කැබලි විස්තර ලැයිස්තුවෙන් නිරීක්ෂණය වන බැවින් මෙම නඩුවේ පාර්ශවකරුවෙකු ලෙස සහභාගී වී ඉඩමේ අයිතිය තහවුරු කර ගන්නා ලෙස ඉඩම් කොමසාරිස් මහියංගනය වෙත උපදෙස් යොමු කර ඇත. | නොපමාව බදුකරයක් ලබා දීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | මහනුවර මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩත්තාව ගමේ පිහිටි පිඹුරු අංක අ.ගු.පි 08 හි කැබලි අංක 814 හි හෙක්ටයාර් 1.214 කින් යුත් ඉඩම 2021 මාර්තු 16 දින සිට වසර 5කට වරක් බදු සංශෝධනය කිරීමේ පදනම යටතේ පුද්ගලික සමාගමක් වෙත බදු දී තිබුණි. එම ආයතනය ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 4/10/16292 හා 2011 නොවැම්බර් 23 දිනැති ලිපියෙහි අනුමැතිය යටතේ පුද්ගලික ආයතනයක් වෙත අතුරු බදු දී තිබුණි. කෙසේ නමුත් අතුරු බදු ලබාගත් ආයතනය විසින් බදු පැහැර ඇති අතර 2020 හා 2021 වර්ෂ දෙකට අදාළ හිඟ බදු මුදල් සඳහා අයකරන සියයට 10 ක් වූ පොලී මුදල්ද කපාහැරීමට තීරණය කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට හිඟ බදු මුදල රු.2,465,040 ක් බව නිරීක්ෂණය විය. | මහනුවර දිස්ත්‍රික්කයේ මිනිපේ ප්‍රා.දේ.ලේ.කො . අයත් 4/10/16292ගොනුවට අදාළව මේ දක්වා වන හිඟ බදු මුදලින් රු.1,907,760 ක මුදල 20.2024.03දිනැතිව මහියංගණය අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් වෙත ගෙවා ඇත. | හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ලුණුගම්වෙහෙර නව නගර ගමේ අ.භූ.පි.03 දරණ පිඹුරේ කැබලි අංක 7061 1/3 න් දැක්වෙන හෙක්ටයාර් 0.110 ක් නේවාසික කටයුතු සඳහා 2019 සැප්තැම්බර් 19 වන දින සිට බදු අංක 4/10/68540 යටතේ බදුකරුවෙක් වෙත වාර්ෂික බදු | හෙට්ටි ආරච්චිගේ සුනීතා චාන්දනි මිය නමින් නේවාසික කටයුතු සඳහා නිර්දේශ එවා ඇති අතර ඒ සඳහා අනුමැතිය 2022.01.31 දිනැතිව ලැබී 2022.03.24 ඉඩම් භාරදීම සිදු කර ඇත. 2019 වර්ෂයේ සිට බදු අනුමැතිය හිමි වුව ද ඉඩමට අදාළ තක්සේරුව ලැබී ඇත්තේ 2023.03. 01 වන දිනයි. ඒ අනුව දෙබරවැව ඉඩම් කොමසාරිස් විසින් බදුකරුට බදු මුදල් ගෙවන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව | හිග බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුදල රු.48,720 බැගින් බදු දී ඇතත් බදු දුන් වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දිනට නියමිත බදු මුදල වන රු.243,600 ක් ගෙවා නොතිබුණි. | 2024.01.17 දිනැතිව රු. 194,880 ක මුදලක් ගෙවා ඇත. | |
| (එ) | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වීරවිල නව නගරයේ කඩයිම් සිතියම් අංක 830003 හි කැබලි අංක 112 හි හෙක්ටයාර් 0.1040 ක් බදුකරුවෙක් වෙත බදු ගොනු අංක 4/10/40305 මගින් 2012 ජුනි 07 දින සිට අවුරුදු 30 ක් දක්වා නේවාසික කටයුතු සඳහා වාර්ෂික බදු මුදල රු.18,080 කට බදු දී ඒ සඳහාඅයවිය යුතු බදු මුදල රු.216,960 ක් විය. 2023 දෙසැම්බර් 31 දිනට බදු දී වසර 11 ක් ගත වී ඇතත් මේ දක්වා කිසිදු බදු මුදලක් ගෙවා නොතිබුණි. | එල්.වයි.නිහිල් මයා නමින් නේවාසික කටයුතු සඳහා නිර්දේශ එවා ඇති අතර ඒ සඳහා අනුමැතිය ලැබී ඇත .බදුකරුට බදු මුදල් ගෙවන ලෙසත් එසේ නොගෙවන්නේ නම් සිවිල් නඩු විධි විධාන සංග්‍රහ පනත ප්‍රකාරව නඩු පැවරීමට සිදු වන බවට 2022.03.24දිනැතිව නීති නිලධාරි විසින් දන්වා ඇත .නැවත වතාවක් ප්‍රතිචාරයක් නොමැතිවීම හේතුවෙන් 2023.11.06දිනැති ලිපිය මඟින් 2023.12.31 දිනට ප්‍රථම බදු මුදල් නොගෙවන්නේ නම් බදු අනුමැතිය අවලංගු කිරීමට සිදු වන බව බදුකරුට දන්වන ලදී 2024.02.12 .දිනැතිව බදුකරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා නොපමාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඒ) | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ලුණුගම් වෙහෙර නව නගරයේ අ.ගු.පි.03 පිඹුරේ කැබලි අංක 5655 හි හෙක්ටයාර් 0.013 ක ඉඩම වාණිජ කටයුතු සඳහා 2004 වර්ෂයේ සිට අවුරුදු 30 ක් දක්වා වසර පහෙන් පහට බදු සංශෝධනය කිරීමේ පදනම යටතේ බදු අංක 4/10/19693 මගින් බදුකරුවෙක් වෙත බදු දී තිබුණි.කෙසේ නමුත් 2004 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු බදු මුදල රු.1,069,140 ක් වුවද එම මුදල ගෙවා නොතිබුණි. | කනංකේ ලියනගමගේ තිස්ස ආරියදාස මයා නමින් නේවාසික කටයුතු සඳහා නිර්දේශ එවා ඇති අතර ඒ සඳහා බදු අනුමැතිය ලැබී ඇත. බදුකරු බදු ගෙවා නොමැති බැවින් බදු අනුමැතිය අවලංගු කිරීමට කටයුතු කරන ලෙස දෙබරවැව ඉඩම් කොමසාරිස් විසින් ඉල්ලා ඇති අතර, ඒ අනුව 2023.09.27 දිනැති ලිපිය මඟින් 2023.11.10 දිනට ප්‍රථම බදු නොගෙවන්නේ නම් බදු අනුමැතිය අවලංගු කිරීමට සිදු වන බව බදුකරුට දන්වා ඇති අතර, එදිනට ප්‍රථම බදු නොවෙන්නේ නම් මා වෙත වාර්තා කරන ලෙස දෙබරවැව ඉඩම් කොමසාරිස් වෙත 2024.02.14 දිනැතිව දන්වා ඇත. මේ දක්වා ප්‍රතිචාරයක් නොමැති බැවින් හිඟ බදු අය කර ගැනීමට අදාළව නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අදාළ ලේඛන යොමු කරන ලෙස 2024.04.01 දින දෙබරවැව ඉඩම් කොමසාරිස් දැනුවත් කර ඇත | එම |
| (ඔ) | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව රජයේ ඉඩම් කළමණාකරණයට අදාළව රජයේ ඉඩම් තොරතුරු හා කළමණාකරණ පද්ධතිය (E-Slim) ඔස්සේ ස්වයංක්‍රීයව සිදු කරමින් රටේ ආර්ථික හා සමාජයීය සංවර්ධනය වෙනුවෙන් මෙම තොරතුරු පද්ධතිය | e-Slims පද්ධතිය 2016 වර්ෂයේ දී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ද සහිතව E-රාජ්‍ය ප්‍රතිපත්තිය මත ආරම්භ කර ICTA ආයතනය මඟින් ආරම්භ කර ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.තවද 2011 වර්ෂයේදී බස්නාහිර පළාත ඉලක්ක කරගත ඉඩම් තොරතුරු හා කළමණාකරන පද්ධතියක් ලෙසින් ආරම්භ කර | සැලසුම්ගතව E-Slim පද්ධතිය සඳහා වැය කරන පිරිවැයට සාපේක්ෂව පද්ධතියේ කටයුතු වැඩිදියුණු |

| | | | |
|---|---|---|---|
| | පවත්වාගෙන යාම අරමුණු කර ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය හා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සමඟ ක්‍රියාත්මක කරන ලද රජයේ ඉඩම් කළමණාකරණ පද්ධතිය (E-Slim) 2016 වර්ෂයේදී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව ආරම්භ කර තිබුණි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව අනුව ඒ සඳහා වැය වන මුදල රු.මිලියන 119.6 ක් ලෙස හා එම වැඩ සටහන වසර 05 ක් තුළ අවසන් කිරීමට ඇස්තමේන්තුගත කර පද්ධතියේ නඩත්තු, සේවා කටයුතු සහ වැඩිදියුණු කිරීම් සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2019 ජුලි 12 දින සිට 2022 ජුලි 11 දින දක්වා වර්ෂ 03 ක් සඳහා වාර්ෂිකව රු.4,950,000 ක් බැගින් ගෙවීම් කිරීමට ගිවිසුම් ගත වී තිබුණි. 2013 වර්ෂයේ සිට 2023 දක්වා වැයකර ඇති මුළු වියදම රු. 193,086,520 ක් වුවද විගණිත දිනය වු 2024 මාර්තු 25 දින වන විටද එම කටයුතු ක්‍රියාත්මක තත්ත්වයට පත්කර දෙපාර්තමේන්තුවට භාරදී නොතිබුණි. | ඇති රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමණාකරන පද්ධතිය සඳහා ප්‍රසම්පාදන කටයුතු දියත් කර ඇත්තේ ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය විසිනි. අරායා බිස්නස් සොලූෂන් පෞද්ගලික සමාගම සමග ගිවිසුම් ගතව පද්ධතියේ පළමු අදියරේ සංවර්ධන කටයුතු හා නඩත්තු කටයුතු ඉටුකරගෙන 2013.04.01 සිට 2014.03.31 දක්වා වූ කාල සීමාව සඳහා ඍජු කොන්ත්‍රාත් ක්‍රමය අනුගමනය කරමින් ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කර ඇත.දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ දැනුම් දීම මත පත් කරන ලද විශේෂ කමිටුව විසින්ද 2018.12.31 දින වාර්තාව මගින් පෙර වර්ෂයේ ගිවිසුම්ගතව පද්ධතියට අදාල නඩත්තු හා සේවා කටයුතු එම පෞද්ගලික සමාගම තෝරා ගැනීමට විරුද්ධත්වයක් නොදක්වන බවයි. ගිවිසුම්ගත කිරීමේ කාලය ඉදිරියට රැගෙන විත් ඇති අතර, 2019.07.12 පසු ඉදිරි කාලය සඳහා මහා භාණ්ඩාගාරයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු හමු වී උපදෙස් ලබාගැනීමට කටයුතු කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 හා 3.6 උපවගන්ති අනුව මෙබදු පරිගණක පද්ධතියක ප්‍රබව කේතය (Source Code) හා වසම (Domain) නිර්මාණය කරන ලද ආයතනය වෙතම ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ වු සේවාවක් වශයෙන් නඩත්තු හා සේවා කටයුතු සඳහා භාර දීම වඩාත් සුදුසු බවත් එය වඩාත් ප්‍රායෝගික බවත් පවසමින් වාචික උපදෙස් මත එකී ආයතනයම නැවත ගිවිසුම්ගත වීමට අදාල ප්‍රසම්පාදන කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.2024 වර්ෂයේ මාර්තු 25 පසුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ප්‍රසම්පාදන කමිටුව අදාල කමිටුම වසරක කාලයක් දීර්ඝ කර ඇත. | කරගත යුතුය. |
| (ඔ) | E-slims පද්ධතිය මගින් රජයේ ඉඩම් හදුනාගෙන එම ඉඩම් වලින් බැහැර කළ හා බැහැර නොකළ ඉඩම් සංඛ්‍යාව 2022 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා පිළිවෙලින් 68,014 හා 10,423 ක් ලෙස වාර්තා කර තිබුණි.කෙසේ නමුත් භූගෝලීය තොරතුරු විද්‍යා තාක්ෂණය ඔස්සේ සිතියම් ගත කළ ඉඩම් සඳහා පද්ධතිය තුළ මෙතෙක් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.එසේම මෙම පද්ධතිය | භූගෝලීය තොරතුරු විද්‍යා තාක්ෂණය ඔස්සේ ඉඩම් සිතියම්ගත කර පද්ධතියට උඩුගත කිරීමේ හැකියාව පද්ධතිය සතුව මේ වන විට පවතින අතර උතුරු පළාත් ඉඩම් රාජකාරි කටයුතු සිදුකරන විට මෙම පහසුකම බහුලව භාවිත කරන බවට හඳුනාගෙන ඇත. මෙයට අදාල නව යෙදුම යාවත්කාලීන කිරීමේ කටයුතු අරායා බිස්නස් සොලූෂන්ස් පෞද්ගලික සමාගම විසින් සිදු කර අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදු කිරීමට මේ වන විට ලබා දී ඇත. e-Slims පද්ධතියේ අරමුණ වනුයේ රජයේ ඉඩම් | සිතියම් ගත කළ ඉඩම් සඳහා පද්ධතිය සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආරම්භ කර දැනට වසර 10 ක් ගත වී ඇතත් පළාත්, දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සමස්ථ රජයේ ඉඩම් ප්‍රමාණය හා එයින් බැහැර කර ඇති හෝ නොමැති ප්‍රමාණය නිශ්චිතව හදුනා ගෙන නොතිබුණි. | කළමණාකරණය ඩිජිටල්කරණයට ලක්කරමින් රටේ ආර්ථික හා සමාජයීය සංවර්ධනය වෙනුවෙන් කටයුතු කිරීම වන බැවින් මෙම කාර්යාලීය කටයුතු කඩිනම් කිරීම වෙනුවෙන් ස්ථාපිත කරන ලද පද්ධතියකි. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සහ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කර්යාල මට්ටමින් පද්ධතියට දත්ත ඇතුලත් කල පසු එය දත්ත ගබඩාවක් ලෙස භාවිත කිරීමේ හැකියාව පවතී. | |
| (ක) | හම්බන්තොට, මිනුවන්ගොඩ, මහියංගනය, තිස්සමහාරාමය හා කුරුණෑගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව විගණනයට ලද තොරතුරු අනුව 2013 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් දක්වා මිනුවන්ගොඩ ඉඩම් කැබලි 19 ක්, තිස්සමහාරාමය ඉඩම් කැබලි 10,786 ක්, කුරුණෑගලින් රූඩ් 05 පර්චස් 20 ක් හඳුනාගෙන එම ඉඩම්වලින් පිළිවෙළින් කැබලි 19 ක්, කැබලි 6,841 ක් හා රූඩ් 05 පර්චස් 20 ක් බැහැර කර තිබුණි. එසේම මිනුවන්ගොඩ හා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් පිළිවෙළින් පර්චස් 80, රූඩ් 05 පර්චස් 20 ක් ලෙස නිවාස අරමුණින් බැහැර කර ඇති අතර කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ රූඩ් 05 පර්චස් 33 ක අනවසරයෙන් පදිංචිව සිටින පුද්ගලයන් සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන කටයුතු කරමින් පවතින බව දන්වා ඇතත් අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 හි තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවීය. | පිළිතුරු ලබාදී නොමැත. | ඉඩම් බැහැර කිරීම් නිවැරදිව සිදු කළ යුතුය. |
| (ග) | වාණිජ පදනමින් දීර්ඝ කාලීන බදු දී ඇති ඉඩම් සඳහා බදු සහන ලබා දීමට ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ අතුරින් 2021 පෙබරවාරි මස 01 දිනැති අංක 2020 / 06 (1) දරන චක්‍රලේඛය සහ ඊට අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දීර්ඝ කාලීන බදු පදනම මත රජයේ ඉඩම් ලබාගෙන ඇති බදුකරුවන් සඳහා බදු සහන ලබා දීම යටතේ බදු සහනය හිමි බදුකරුවන් සඳහා වන බදු මුදල ගණනය කිරීමේදී දෙවන බදු කාලය ආරම්භ වන දිනයේ | අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අයත් වානිජ බදුකරුවන් 8දෙනෙකු විසින් ඔවුන්ගේ දෙවන බදු කාලය 2017 ට පෙර ආරම්භ වී ඇතත් 2017/01 ,චක්‍රලේඛ ප්‍රකාරව දෙවන බදු කාලය ආරම්භයේ බදු මුදල් ගණනය කිරීම සඳහා සහන ලබා දෙන ලෙස ඉල්ලීමට මෙම බදු සහනය මෙම බදුකරුවන් වෙත ලබා දෙන ලෙස අමාත්‍යාංශ ලේකම් වෙතින් උපදෙස් ලැබී ඇත .ඒ අනුව මෙම බදු සහන ලබා දී ඇති අතර , 2024.02.03හා 2024.03.05දිනැති ජාතික විගණන කාර්යාල විමසුම් මහින් මෙම බදු සහනය මත රජය ට අයවිය යුතු ජාතික ආදායම | නොපමාව අහිමි වී ඇති බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

සිට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දුන් 2020 නොවැම්බර් 16 දින දක්වා දෙවන බදු කාලයට අදාලව ගනු ලැබූ තක්සේරුව මත බදු මුදල් නිවැරදිව ගණනය කර අය කල යුතු වුවත් ඊට පටහැනිව අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් අමතන ලද 2022 නොවැම්බර් 10 දිනැති අංක 4 / 10 /පොදු / බදු සහන (L 2 ) දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ලිපිය අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ බදු ගොනු 08 ක් සම්බන්ධයෙන් වූ බදු අය කළ යුතු ආකාරය දන්වා එවා තිබීම නිසා රජයට රු.70,518,510 ක බදු මුදලක් අහිමි වී තිබුණි. එසේම එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වාණිජ පදනමින් දීර්ඝ කාලීන බදු දී ඇති ඉඩම් ගොනු අතරින් ඉහත චක්‍රලේඛය සදහන් දෙවන බදු කාලය ආරම්භ වන දීර්ඝ කාලීන වාණිජ බදු ගොනු 82 ක් පවතින බව නිරීක්ෂණය වූ අතර ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2022 නොවැම්බර් 10 දිනැති අංක 4/10/ පොදු / බදු සහන (L2 ) ලිපිය මඟින් බදු ගොනු 08 කට පමණක් චක්‍රලේඛය අභිබවා බදු සහන ලබා දීමට කටයුතු කර තිබීම නිසා එකී බදු ගොනු 82 න් බදු ගොනු 74 ක බදුකරුවන් බදු ගෙවීම් අධෛර්යමත් වීමේ අවධානමක් ඇති විය හැකි බව තවදුරටත් නිරීක්ෂණය විය.

අහිමි වී ඇති බැවින් 2020/6 (I) චක්‍රලේඛ අනුකූලව නැවත බදු අය කරන ලෙසට අප වෙත දැනුම් දී ඇත. ඒ අනුව මෙම බදු අය කිරීම සම්බන්ධ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් දැනුවත් කිරීමට ප්‍රථමව බදු අය කළ යුතු ආකාරය සම්බන්ධයෙන් 2024.04.05 දිනැති අමාත්‍යාංශ ලේකම් වෙතින් විමසීමක් සිදු කොට ඇත.

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කළමනාකරණය පිලිබඳ ඉදිරිපත් කල තොරතුරු අනුව අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පහත දැක්වේ. | | |

| | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| | ------ | ------ | ----- |
| ජ්‍යෙෂ්ඨ | 95 | 37 | 58 |
| තෘතියික | 38 | 04 | 34 |
| ද්විතියික | 660 | 517 | 143 |
| ප්‍රාථමික | 140 | 95 | 45 |
| **එකතුව** | **933** | **653** | **280** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ 58 ක්ද,තෘතියික කාර්ය මණ්ඩලයේ 34 ක්ද, ද්විතීයික කාර්ය මණ්ඩලයේ 143 ක් සහ ප්‍රාථමික කාර්ය මණ්ඩලයේ 45ක් වශයෙන් සමස්ත පුරප්පාඩු 280ක් පැවතුණි. | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල 06 ක් බවට පත් කර ඇති අතර ඒ අනුව මිනින්දෝරු නිලධාරීන් 51 ක් පෙන්නුම් කරනු ලැබේ. ජනපද නිලධාරීන් 135 ක පුරප්පාඩු සඳහා නිලධාරීන් 54ක් විවෘත පදනම මත බඳවා ගැනීමට එම පුරප්පාඩු සඳහා විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට පියවර ගෙන ඇත. දෙපාර්තමේන්තු ගත වැඩ අධිකාරී තනතුරු 21 න් තනතුරු 13 ක් යටපත් කර ඉතිරිව පවතිනුයේ වැඩ අධිකාරී තනතුරු 8ක් පමණි. ප්‍රාථමික සේවා ගණවල පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන සහයක නිලධාරීන් 04 ක් රියදුරු ලෙස ද කාර්යාල කාර්ය සහයක සේවක නිලධාරීන් 07 ක් සහ දෙපාර්තමේන්තුගත පත්වීම් සඳහා නිලධාරීන් 04 කුත් වශයෙන් 15 කු බඳවා ගන්නා ලද | පුරප්පාඩු සම්පූර්ණ කිරීම හෝ අවශ්‍යතාවය අනුව කාර්ය මණ්ඩලය සංශෝධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුව තුළ සංවර්ධන සහකාර නිලධාරීන් 260ක් අනුමත වී ඇතත් තත්‍ය සංඛ්‍යාව 318 ක් වූයෙන් එම තනතුරු 58ක අතිරික්තයක් පැවතුණි. | අනුමත MN 4 ගණයේ වැඩසටහන් නිලධාරී(ඉඩම්) තනතුරු 60 ක් සහ වැඩසටහන් නිලධාරී තනතුරු 200 ක් වශයෙන් මුළු තනතුරු සංඛ්‍යාව 260ක් වන අතර සේවා අවශ්‍යතාවය මත තවත් සංවර්ධන නිලධාරී තනතුරු 82 ක් අනුමත කර දෙන ලෙස ඉල්ලා ඇත. සේවයේ නියුතු මුළු නිලධාරීන් සංඛ්‍යාව 309 ක් වන අතර තවත් නිලධාරීන් 08 දෙනෙකු තවමත් සංවර්ධන සහකාර තනතුරු දරනු ලැබේ. ඔවුන් අතුරින් 07 දෙනෙක් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට ඉල්ලා ඇතත් එක් නිලධාරියකු තවමත් සංවර්ධන සහකාර තනතුරේ රැඳී සිටියි. එබැවින් තනතුරු 316 ක තනතුරු නාමය සංවර්ධන නිලධාරී වශයෙන් සහ එක් තනතුරක් සංවර්ධන සහකාර වශයෙන් සංශෝධනය කර දෙන ලෙස ඉල්ලා ඇත. එකී අනුමැතිය ලද පසු මෙම අතිරික්තය අහෝසි වන බව දන්වමි. | පවත්නා කාර්ය මණ්ඩලය සමාලෝචනය කළ යුතුය. |